# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1757/20 – 2012 මැයි 11 වැනි සිකුරාදා – 2012.05.11

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

මගේ අංකය: මා/සං/02/197 II වෙළුම.
ඉඩම් අමා. අංකය: එල්ඩී/05/2008/එච්ඩබ්/439.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම් ලබාගැනීමට රජය අදහස් කරන බැව්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩම්වල විස්තර:

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, මහර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අධිකාරි පත්තුව සුළු කොට්ඨාසයේ කිරිල්ලවල ගමේ මැනුම්පති විසින් පිළියෙල කර ඇති ගම්. 3806 සහ 2012 මාර්තු මස 10 දිනැති මූලික පිඹුරේ කැබලි අංක 02න් පෙන්නුම් කෙරෙන මුළු ප්‍රමාණයෙන් හෙක්. 0.0025ක් වූ පහත විස්තර කෙරෙන ඉඩම් කැබලි දෙක (02):

මූ.පි.ගම්. 3806.

01. **කැබලි අංක 01**
ඉඩමේ නම: මිල්ලගහවත්ත; විස්තරය: මාර්ගය; හිමිකම් කියන අය: මංගලා වික්‍රමසිංහ, දළුපිටිය, මහර, කඩවත; ප්‍රමාණය: හෙක්. 0.0021.

02. **කැබලි අංක 02**
ඉඩමේ නම: මිල්ලගහවත්ත; විස්තරය: ස්ථිර ගොඩනැගිල්ලක කොටසක් ඇත; හිමිකම් කියන අය: මංගලා වික්‍රමසිංහ, දළුපිටිය, මහර, කඩවත; ප්‍රමාණය: හෙක්. 0.0004.

ඉහත සඳහන් ඉඩම්වලට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 2012 ජූලි මස 11 වැනි දින පූ.භා. 10.00ට මහර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුය.

තවද, 2012 ජූනි මස 27 වන දිනට මත්තෙන් ඒ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය.

තමරා ඩී. පෙරේරා,
ප්‍රාදේශීය ලේකම්,
මහර.

2012 මැයි මස 02 වැනි දින,
මහර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදීය.

05 - 623

---

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

මගේ අංකය: මහර/සං/01/01/එම්ඩබ් (i) 3 වෙළුම.
ඉඩම් අමා. අංකය: එල්ඩී/05/2008/එච්ඩබ්/455.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබාගැනීමට රජය අදහස් කරන බැව්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර:

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, මහර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මැද පත්තුව සුළු කොට්ඨාසයේ පස්ගම්මන ගමේ මැනුම්පති විසින් පිළියෙල කර ඇති ගම්. 3825 සහ 2011 දෙසැම්බර් මස 22 දිනැති මූලික පිඹුරේ කැබලි අංක 01 වශයෙන් පෙන්නුම් කෙරෙන මුළු ප්‍රමාණයෙන් හෙක්. 0.0024ක් වූ පහත විස්තර කෙරෙන ඉඩම් කැබලි එක (01):

මූ.පි.ගම්. 3825.

01. **කැබලි අංක 01**
ඉඩමේ නම: කහටගහවත්ත; විස්තරය: මුඩුබිම; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: විනීතා ලියනගේ, අංක 90/5. පස්ගම්මන, බුත්පිටිය; ප්‍රමාණය: හෙක්. 0.0024.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 2012 ජුනි මස 25 වැනි දින පූ.හා. 10.00ට මහර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුය.

තවද, 2012 ජුනි මස 11 වන දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය.

තමරා ඩී. පෙරේරා,
ප්‍රාදේශීය ලේකම්,
මහර.

2012 අප්‍රේල් මස 25 වැනි දින,
මහර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

05 - 624

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.